# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/66 - 2017 ජනවාරි මස 20 වැනි සිකුරාදා - 2017.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය

2016.12.27 වැනි දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.01.05 වැනි දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය**

2016.12.01 වැනි දින සභා සම්මත කරන ලදුව 2017.01.05 වැනි දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ,<br>
සභා ලේකම්,<br>
සබරගමුව පළාත් සභාව.

2017 ජනවාරි මස 18 වැනි දින,<br>
සබරගමුව පළාත් සභාවේ දී ය.

### සබරගමුව පළාතේ පළාත් සභාව

විසර්ජන ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාව 2017

**විසර්ජන ප්‍රඥප්තිය අංක 04**

**2016**

2017 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා සබරගමුව පළාත තුළ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් වියදම් සඳහා ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, සබරගමුව පළාත් සභා අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට අනුෂාංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ ප්‍රඥප්තියකි.


1A - PG 3352 — 12 (2017/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2017 මුදල් වර්ෂය සඳහා විසර්ජන.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලයදෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ ප්‍රඥප්තියෙහි ''2017 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කරනු ලබන, 2017 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2017 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් මිලියන විසිපන්දහස් හත්සිය නමයකුත් දෙසිය දහසක් (රු. 25,709,200,000) වූ සබරගමුව පළාත් සභාවේ වියදම් :-

(අ) සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින් හා

(ආ) සබරගමුව පළාත තුළ ණය වශයෙන් ලබා ගන්නා මුදල්වලින් හෝ සබරගමුව පළාත් සභාව සඳහා ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින් පියවිය යුතු ය. මෙහි ඉහත සඳහන් කළ රුපියල් මිලියන විසිපන්දහස් හත්සිය නමයකුත් දෙසිය දහසක් (රු.25,709,200,000) වූ මුදල මේ ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන සබරගමුව පළාත් සභාව සඳහා හා එය වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියකට විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

2017 මුදල් වර්ෂය සඳහා සබරගමුව පළාත් සභාවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම.

3. (1) 2017 මුදල් වර්ෂය තුළදී, මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවේ සඳහන් එක් එක් කටයුත්තෙන් සබරගමුව පළාත් සභාවට ලැබෙන VI වන තීරුවෙහි සඳහන් ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළයුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්ථය, VI තීරුවෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එසේ ලැබෙන ශුද්ධ අතිරික්තයක් වේ නම්, එය 2017 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර සබරගමුව පළාත් සභා අරමුදලට ගෙවිය යුතු ය.

(2) 1 වන උප වගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිගමනය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) කිසියම් කටයුත්තක ආදායමට අයවිය යුතුව නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපනය හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තක ආදායමින් අඩු කළ යුතු ය.

4. මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 2017 මුදල් වර්ෂය තුළ සබරගමුව පළාත් සභාව විසින් කරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් සබරගමුව පළාත් සභාව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ V වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

5. මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2017 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ VII තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය. තවද, එම මුදල් වර්ෂය අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් VIII වන තීරුවෙහි අනුරූප සටහනෙහි දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

2017 මුදල් වර්ෂය තුළදී 3 වන වගන්තියේ සඳහන් කටයුතු පිළිබඳ වියදම් සඳහා සබරගමුව පළාත් සභා අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළහැකි වෙනත් අරමුදලකින් නැතහොත් මුදල් වලින් අත්තිකාරම් ගෙවීම.

6. 2017 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ ප්‍රඥප්තියේ දෙවන උප ලේඛනයේ IV වන තීරුවෙහි දැක්වෙන යම් කටයුත්තකින් සබරගමුව පළාත් සභාවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන්, සබරගමුව පළාත් සභාව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා යයි අමාත්‍යවරයා සළකන මුදල් සබරගමුව පළාත් අරමුදලෙන් හෝ සබරගමුව පළාත් සභාව විසින් සුදුස්සක් කළහැකි හෝ වෙනත් අරමුදලක් හෝ මුදල් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කළ විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්ථය එම උපලේඛනයේ පස්වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට සබරගමුව පළාත් සභා අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

වැඩ සටහන පුනරාවර්තන වියදම් සඳහා වෙන්කරන ලද නමුත් වියදම් නොකරන ලද මුදල් ඒ වැඩ සටහනේම වෙනත් වෙන් කිරීමකට හෝ ඒ වැය ශීර්ෂය යටතේම වූ වෙනත් වැඩසටහනකට හෝ මාරු කිරීමේ බලය.

7. (1) මේ ප්‍රඥප්තියෙහි පළමුවන උප ලේඛනයේ සඳහන් යම ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩසටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට එම උප ලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබූවා වූ ද, එහෙත් වියදම් නොකර ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු වියහැකි වූද යම් මුදලක්, එම වැඩසටහනේම මූලධන වියදම් වශයෙන් හෝ වෙනත් වැඩසටහනක පුනරාවර්තන හෝ මූලධන වියදම් වශයෙන් හෝ වෙන් කිරීමට හෝ ප්‍රධාන ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධාරියෙකුගේ හෝ නියමය අනුව මාරුකළ හැකි ය.

(2) මේ ප්‍රඥප්තියෙහි පළමුවන උප ලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන මූලධන වියදමට වෙන් කරන ලද මුදලක් ඒ ශීර්ෂයේ වැඩසටහනෙන් හෝ ව්‍යාපෘතියෙන් පිටතට මාරු කිරීම ප්‍රධාන ලේකම්වරයාට පමණක්ම කළ හැකි ය.

8. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු වියහැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල තවදුරටත් අවශ්‍ය නොවන බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, සබරගමුව පළාත් සභා අරමුදලින් හෝ සබරගමුව පළාත් සභාව හෝ සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් ම හෝ ඉවත් කරගැනීම, අමාත්‍යවරයා විසින් සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකි ය.

මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන උපරිම හා අවම සීමා වෙනස් කිරීමට අමාත්‍යවරයාට ඇති බලය

9. අමාත්‍යවරයා විසින්, සබරගමුව පළාත් සභාවේ අනුමැතිය ඇතිව :-

(අ) මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ V වන තීරයෙහි, VII වන තීරයෙහි සහ VIII තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්

(ආ) මේ ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනයේ VI වන තීරයෙහි දැක්වෙන අවම සීමා :
නියමයන් මගින් 2017 මැයි මස 31 දින හෝ එදිනට පෙර, වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක්, යෝජනා සම්මතයක් මගින් සබරගමුව පළාත් සභාව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවැත්විය යුතු ය.

එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයක ද, ඒ දිනට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතවම සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතු ය.

10. සබරගමුව පළාත් සභාව විසින්, යෝජනා සම්මතයක් මගින්, මේ ප්‍රඥප්තියෙහි දෙවන උප ලේඛනයෙහි උචිත තීරුවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ :-

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්.

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

## පළමුවන උපලේඛනය

*පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්*

**ශීර්ෂ 800 සිට 861 දක්වා**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | 23,245,250,000 |
| ප්‍රාග්ධන වියදම් | 2,463,950,000 |
| එකතුව | 25,709,200,000 |

| ශීර්ෂය | ආයතනය හා වැඩ සටහන | පුනරාවර්තන වියදම් රුපියල් | ප්‍රාග්ධන වියදම් රුපියල් |
|---|---|---|---|
| 800 | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 80,630,000 | 4,000,000 |
| 801 | පළාත් සභා ලේකම් කාර්යාලය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 186,502,000 | 5,000,000 |
| 802 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 14,535,250 | 1,000,000 |
| 803 | සමූපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 8,914,000 | - |
| 804 | ප්‍රධාන ලේකම් | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 269,094,000 | 420,950,000 |
| 805 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 26,200,200 | - |
| 806 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 36,770,000 | - |
| 807 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන) | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 42,688,200 | - |
| 808 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | | |
| | වැඩ සටහන 50 ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 223,324,200 | - |
| 809 | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 56,625,000 | - |
| 810 | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුභ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදි කිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 164,659,500 | 5,000,000 |
| | වැඩ සටහන 47 ප්‍රවාහන සේවා | - | 25,000,000 |
| | වැඩ සටහන 49 විදුලි බල හා බල ශක්ති සේවා | - | 15,000,000 |
| | වැඩ සටහන 53 සමූපකාර සංවර්ධනය | - | 7,000,000 |
| | වැඩ සටහන 60 ප්‍රජා සංවර්ධනය | - | 40,000,000 |
| | වැඩ සටහන 61 නිවාස හා ප්‍රජා පහසුකම් | 1,922,500 | 15,000,000 |
| | වැඩ සටහන 63 වැවිලි යටිතල පහසුකම් හා වතු නිවාස | - | 25,000,000 |
| | වැඩ සටහන 71 රෝහල් සේවාවන් | - | 418,000,000 |
| | වැඩ සටහන 72 මහජන සෞඛ්‍ය සේවාවන් | - | 182,000,000 |

**පළමුවන උපලේඛනය** (සම්බන්ධිතයි)

| ශීර්ෂය | ආයතනය හා වැඩ සටහන | පුනරාවර්තන වියදම් රුපියල් | ප්‍රාග්ධන වියදම් රුපියල් |
|---|---|---|---|
| | වැඩ සටහන 73 දේශීය වෛද්‍ය සේවාවන් | - | 40,000,000 |
| | වැඩ සටහන 93 ආගමික හා සංස්කෘතික කටයුතු | - | 25,000,000 |
| | වැඩ සටහන 96 කාන්තා සංවර්ධනය | - | 7,000,000 |
| 811 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 179,847,236 | - |
| | වැඩ සටහන 71 රෝහල් සේවාවන් | 3,974,471,000 | - |
| | වැඩ සටහන 72 මහජන සෞඛ්‍ය සේවාවන් | 969,623,000 | - |
| 812 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 73 දේශීය වෛද්‍ය සේවාවන් | 377,553,000 | - |
| 813 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 53 සමූපකාර සංවර්ධනය | 89,939,500 | - |
| 814 | පළාත් පාලන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 60 ප්‍රජා සංවර්ධනය | 2,023,988,700 | - |
| 820 | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 61,881,500 | - |
| | වැඩ සටහන 50 ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 275,000,000 | 240,000,000 |
| | වැඩ සටහන 52 ප්‍රාදේශීය සංවර්ධනය | - | 30,000,000 |
| | වැඩ සටහන 90 විනෝද කටයුතු හා ක්‍රීඩා | - | 77,000,000 |
| 821 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 90 විනෝද කටයුතු හා ක්‍රීඩා | 27,296,400 | - |
| 830 | සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 49,386,000 | - |
| | වැඩ සටහන 51 කර්මාන්ත සංවර්ධනය | - | 27,000,000 |
| | වැඩ සටහන 60 ප්‍රජා සංවර්ධන කටයුතු | 28,457,500 | 66,000,000 |
| | වැඩ සටහන 95 සමාජ ආරක්ෂණය | - | 47,000,000 |
| 831 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 51 කර්මාන්ත සංවර්ධනය | 124,595,500 | - |
| 832 | පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 95 සමාජ ආරක්ෂණය | 282,668,500 | - |
| 840 | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 85,370,000 | - |
| | වැඩ සටහන 80 ප්‍රාථමික අධ්‍යාපනය | - | 220,000,000 |
| | වැඩ සටහන 81 ද්විතියික අධ්‍යාපනය | - | 325,000,000 |
| | වැඩ සටහන 93 ආගමික හා සංස්කෘතික කටයුතු | 11,700,000 | 17,000,000 |
| 841 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 489,224,458 | - |
| | වැඩ සටහන 80 ප්‍රාථමික අධ්‍යාපනය | 4,336,181,148 | - |
| | වැඩ සටහන 81 ද්විතියික අධ්‍යාපනය | 8,138,139,993 | - |
| | වැඩ සටහන 87 අධ්‍යාපන සහභාගිත්වය වැඩිදියුණු කිරීම | 33,810,464 | - |
| | වැඩ සටහන 88 අධ්‍යාපන සැළසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 4,962,000 | - |

**පළමුවන උපලේඛනය** (සම්බන්ධිතයි)

| ශීර්ෂය | ආයතනය හා වැඩ සටහන | පුනරාවර්තන වියදම් | ප්‍රාග්ධන වියදම් |
|---|---|---|---|
| 850 | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 54,348,500 | 25,000,000 |
| | වැඩ සටහන 40 ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | - | 3,000,000 |
| | වැඩ සටහන 43 වාරිමාර්ග හා ජල කළමනාකරණය | - | 30,000,000 |
| | වැඩ සටහන 44 කෘෂිකාර්මික සංවර්ධනය | - | 60,000,000 |
| | වැඩ සටහන 45 පශු සම්පත් සංවර්ධනය | - | 50,000,000 |
| | වැඩ සටහන 55 ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීම | - | 12,000,000 |
| 851 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 40 ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 55,009,000 | - |
| 852 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 44 කෘෂිකාර්මික සංවර්ධනය | 201,421,000 | - |
| 853 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 45 පශු සම්පත් සංවර්ධනය | 240,107,288 | - |
| 861 | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | |
| | වැඩ සටහන 03 පළාත් පරිපාලනය | 18,404,063 | - |
| | | **23,245,250,000** | **2,463,950,000** |

*2017 - ඇස්තමේන්තු*

*අත්තිකාරම් ගිණුම් කටයුතු*

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම් සීමාව* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම් වල උපරිම සීමාව* |
| | **මුළු එකතුව** | | | **1,444,370,000** | **604,945,000** | **2,985,321,100** | **3,300,000** |
| | **පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් :** | | *උප එකතුව* | **1,346,170,000** | **554,145,000** | **2,950,351,100** | - |
| 1. | ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය | 80001 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,000,000 | 600,000 | 5,600,000 | - |
| 2. | පළාත් සභා ලේකම් කාර්යාලය | 80101 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,500,000 | 1,000,000 | 5,130,700 | - |
| 3. | පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභා කාර්යාලය | 80201 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,000,000 | 500,000 | 3,598,100 | - |
| 4. | සමූපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය | 80301 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,200,000 | 350,000 | 3,160,000 | - |
| 5. | ප්‍රධාන ලේකම් | 80401 | පළාත් රා. නි. අත්තිකාරම් | 16,500,000 | 9,500,000 | 60,000,000 | - |
| 6. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) | 80801 | පළාත් රා. නි. අත්තිකාරම් | 19,000,000 | 6,500,000 | 53,000,000 | - |
| 7. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 80901 | පළාත් රා. නි. අත්තිකාරම් | 4,000,000 | 2,000,000 | 11,900,000 | - |
| 8. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81001 | පළාත් රා. නි. අත්තිකාරම් | 6,000,000 | 2,500,000 | 22,700,000 | - |
| 9. | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 81101 | පළාත් රා. නි. අත්තිකාරම් | 246,000,000 | 96,000,000 | 696,865,000 | - |
| 10. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 81201 | පළාත් රා. නි. අත්තිකාරම් | 17,000,000 | 9,000,000 | 44,000,000 | - |
| 11. | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 81301 | පළාත් රා. නි. අත්තිකාරම් | 6,870,000 | 5,000,000 | 16,770,000 | - |
| 12. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 81401 | පළාත් රා. නි. අත්තිකාරම් | 4,000,000 | 1,800,000 | 14,100,000 | - |
| 13. | පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 82001 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,500,000 | 1,200,000 | 8,600,000 | - |
| 14. | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 82101 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,500,000 | 500,000 | 5,300,000 | - |
| 15. | සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය | 83001 | පළාත් රා. නි. අත්තිකාරම් | 8,000,000 | 2,245,000 | 21,155,000 | - |
| 16. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83101 | පළාත් රා. නි. අත්තිකාරම් | 11,600,000 | 8,500,000 | 23,027,000 | - |
| 17. | පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව | 83201 | පළාත් රා. නි. අත්තිකාරම් | 8,000,000 | 2,500,000 | 23,250,000 | - |
| 18. | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 84001 | පළාත් රා. නි. අත්තිකාරම් | 5,000,000 | 2,000,000 | 14,000,000 | - |
| 19. | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 84101 | පළාත් රා. නි. අත්තිකාරම් | 945,000,000 | 387,000,000 | 1,828,000,000 | - |

*2017 - ඇස්තමේන්තු* (සම්බන්ධිතයි)

*අත්තිකාරම් ගිණුම් කටයුතු*

| *i* | *ii* | *iii* | *iv* | *v* | *vi* | *vii* | *viii* |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම්* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම් වල සීමාව උපරිම සීමාව* |
| 20. | ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදනය හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර හා ධීවර කටයුතු අමාත්‍යාංශය | 85001 | පළාත් රා. නි. අත්තිකාරම් | 2,500,000 | 1,100,000 | 13,180,000 | |
| 21. | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 85101 | පළාත් රා. නි. අත්තිකාරම් | 5,000,000 | 2,500,000 | 10,805,000 | |
| 22. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 85201 | පළාත් රා. නි. අත්තිකාරම් | 18,500,000 | 3,800,000 | 42,285,000 | |
| 23. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 85301 | පළාත් රා. නි. අත්තිකාරම් | 11,000,000 | 7,500,000 | 19,500,000 | |
| 24. | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | 86101 | පළාත් රා. නි. අත්තිකාරම් | 1,500,000 | 550,000 | 4,424,300 | |
| | **වෙනත් අත්තිකාරම් ගිණුම්** | | **උප එකතුව** | **98,200,000** | **50,800,000** | **34,970,000** | **3,300,000** |
| 25. | පළාත් සභා ලේකම් කාර්යාලය | 80102 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් | 18,000,000 | 1,000,000 | 24,430,000 | |
| 26. | කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - පුස්සැල්ල | 80502 | පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම් | 9,000,000 | 3,000,000 | 500,000 | 50,000 |
| 27. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 81002 | පරිගණක ව්‍යාපෘති | 600,000 | 250,000 | 400,000 | 150,000 |
| 28. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81003 | පින්නවල ඉපැරණිගම තේමා උද්‍යානය අත්තිකාරම් ගිණුම | 7,500,000 | 2,000,000 | 300.000 | 800.000 |
| 29. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 81004 | සබරගමුව පළාත් රංගශාලා අත්තිකාරම් ගිණුම | 3,800,000 | 1,200,000 | 200.000 | 200,000 |
| 30. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 81202 | පින්නවල පංචකර්ම මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම | 2,800,000 | 800,000 | 940,000 | 400,000 |
| 31. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 81402 | පළාත් පාලන ආයතනවල සභිකයින්ට විවිධ අත්තිකාරම් | - | 50,000 | - | - |
| 32. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83102 | පේෂකර්ම වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය | 30,000,000 | 20,000,000 | 2,500,000 | 500,000 |
| 33. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 83103 | කුඩා කර්මාන්ත වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය | 7,500,000 | 3,500,000 | 3,500,000 | 500,000 |

*2017 - ඇස්තමේන්තු* (සම්බන්ධිතයි)

*අත්තිකාරම් ගිණුම් කටයුතු*

| *i* | *ii* | *iii* | *iv* | *v* | *vi* | *vii* | *viii* |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම්* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම් වල සීමාව උපරිම සීමාව* |
| 34. | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 84002 | මෙනේරිපිටිය - අටළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම | 9,000,000 | 8,000,000 | 2,000,000 | 500,000 |
| 35. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 85302 | උඳුගොඩ සත්ත්ව පාලන සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම | 10,000,000 | 11,000,000 | 200,000 | 200,000 |

02 - 301

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.